# කොකටියගොල්ලෑවේ අලි මන්තර පොත: අලි ඇතුන් හා සම්බන්ධ මන්ත්‍ර හා කෙම් ක්‍රම

වයි. කේ. තිස්ස බණ්ඩාර
පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

---

අපවත් වී වදාළ මහාචාර්ය පූජ්‍ය හඟුරන්කෙත ධීරානන්ද ස්වාමින්ද්‍රයන් වහන්සේ ගුණ සැමරුම කරනු පිණිස සම්පාදනය වූ මෙම ශාස්ත්‍රීය කෘතියට ලිපියක් සැපයීමට අපටද ආරාධනය ලැබිණ. උක්ත ස්වාමින්ද්‍රයන් වහන්සේ වෙනුවෙන් ඉතා කඩිනමින් මෙබන්දක් සම්පාදන කිරීමට උත්සුක වීම අනුව උන්වහන්සේ කෙරෙහි දක්වනු ලබන ගෞරව භක්ති ප්‍රණාම ස්වරූපය අපට වටහා ගත හැකිය. මෙයින් අභිනන්දන යතිවරයාණෝ වසර තිස්පහක පමණ කලෙක සිට අප දන්නා කෙනෙක් වන්නාහ. උන්වහන්සේගේ හදිසි අපවත්වීම අපට දැරිය නොහැකි බරපතල අලාභයකි. ලංකා ඉතිහාසය විෂය පිළිබඳ විශාරද දැනුමක් ලත් උන්වහන්සේ රට දැය සමය වෙනුවෙන් අපිරිමිත සේවයක් සිදු කළහ. මෙහි ප්‍රස්තුත ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙනුවෙන් තුන් මාසේ දානමය පුණ්‍ය කර්මය දින පින් පිණිස පළ කිරීමට නියමිත මෙම කෘතියට ලිපියක් සපයන මෙන් අප දැනුවත් කළේ මහාචාර්ය මහින්ද සෝමතිලකයන්ය. සතියක් ඇතුළත ලිපියක් සැපයීම අසීරු කරුණකි. ආරාධනය පරිදි ලිපියක් සැපයීමට මෙහි ලිපිකරු තෝරා ගනු ලැබූයේ අප්‍රකට පුස්කොළ පිටපතක එන පැරණි යන්ත්‍රමන්ත්‍ර කෙම් ක්‍රම ඇතුළත් දේශීය ඥානය හා බැඳුණු තේමාවකි.

මෙහි මූලික අරමුණ වන්නේ නස්පර්ශිත උරුමය හා බැඳී එහෙත් අභාවයට යමින් පවතින අපේ උරුමයෙන් බිඳක් පාඨක ඔබ හමුවේ තැබීමය. සම්ප්‍රදායික දැනුම පිළිබඳව සාකච්ඡා කිරීමේදී විෂයයන් ගණනාවක් හමුවෙයි. ශ්‍රී ලංකාවේ ඉතිහාසයට අනුව බලන කල පශු සම්පත් කළමනාකරණය බොහෝ ඈතට දිවයනු පෙනෙයි. දඩයම් ජීවිකාවෙන් ඈත් වූ ආදි මානවයා යම් කලෙක සතුන් හීලෑ කිරීම හෝ ගෘහාශ්‍රිත කරණය කිරිම හෝ අනුව ලංකාවේ සත්ත්ව පාලනය දූරාතීතයේ සිටම පැවත එන්නේය. ඒ සත්ත්වයන් අතර අලිඇත්තු විශේෂිත සත්ත්ව කොට්ඨාශයකට අයත් වෙති. බහුකාර්ය අවැසියාවන් වෙනුවෙන් පැරණි ලංකාවේ අලි ඇත්තු ඇල්ලීම, හීලෑ කිරීම, පාලනය කිරිම, සේවාවන් ලබා ගැනීම සිදුවිය. වන අලි ඇත්තුගෙන් සිදුවන උපද්‍රව හරණය සඳහාත් මොවුන් හීලෑකර ගැනීම සඳහාත් විවිධ වූ කෙම් ක්‍රම භාවිතව ඇති අයුරු පැරණි පුස්කොළ පිටපත් ඇතැම් ඒවායෙන් හෙළි වෙයි. එබඳු දුර්ලභ පිටපතක් වර්තමාන ලේඛකයාට ලැබිණ. එය අනුලේඛනය කිරිමෙන් අනතුරුව මෙහි පළ කෙරෙනුයේ මෙම විෂය හා උනන්දුවක් දක්වන අයගේ ප්‍රයෝජන පිණිසය.

දේශීය සහ විදේශීය ලේඛකයන් විසින් ලංකාවේ අලිඇත්තු සම්බන්ධ විවිධ තොරතුරු එකතු කොට පළ කරනු ලැබ ඇති කෘති බොහෝය. ඒවා අතුරින් ප එ ප දැරණියගල මහතා විසින් සම්පාදනය කරනු ලදුව ලංකා ජාතික කෞතුකාගාරයෙන් පළ කළ "අලි පිළිබඳ විද්‍යාව" කෘතිය සුවිශේෂි වන්නේය.[1] පැරණි පුස්කොළ පිටපත් කීපයක් අනුව සම්පාදිත එහි අන්තර්ගතය පහත සඳහන් ශිර්ෂවලට අදාළ වෙයි.

1. හස්තියෝග ශතකය.
2. හස්තියෝග ශතකය හා හස්ති ශිල්පය.
3. ඇත් වෙද පොත.
4. ඇතුන් අලින්ට වෙදකම්.

1. අලි පිළිබඳ විද්‍යාව, සම්. ප එ ප දැරණියගල, ලංකා ජාතික කෞතුකාගාර පුස්කොළ ග්‍රන්ථ මාලා අංක 2, පශු වෛද්‍ය ග්‍රන්ථ පළමු කලාපය, කොළඹ, 1952.



5. ගජයෝග රත්නය.
6. අලිතෝරන පොත.
7. හස්ති චිකිත්සාව
8. මහා ගජ ලක්ෂණ සංග්‍රහව.
9. ශ්‍රී යෝග ශතක.
10. ගජ ලක්ෂණ ශිල්ප විද්‍යාව.

එකි කෘතිය කියවන අයට ලංකාවේ මේ ක්ෂේත්‍රයේ තරම වැටහෙනු ඇත.

මෙහි ලේඛකයාට ලැබී ඇති පුස්කොළ පිටපතෙහි නම ඇත් දොස්කන් පොත යනුයි.[2] අපේ දේශීය දැනුම සංරක්ෂිත බොහෝ එබඳු පිටපත් විවිධ කරුණු කෙරෙන් අභාවයට ගොස් ඇත. පොත් අතුරින් මන්තර පොත් සීමිතය. මන්තර පොත් අතුරින්ද අලි මන්තර පොත් ඉතා දුර්ලභය. අලි මන්තරවල උපයෝගිතා කුමක් සඳහාද? තමන්ගේ ආරක්ෂාව කෘෂි නිෂ්පාදනවල ආරක්ෂාව ඒ අතර ප්‍රධාන වෙයි. එමෙන්ම අලි ඇතුන් හීලෑකර ගැනීම සඳහාද මන්තර වුවමනා කරයි. අලි ඇතුන් හීලෑකර ගත් ආකාරය පිළිබඳව විස්තර ඇතැම් වාර්තා තුළින් හෙළි වෙයි. අලි ඇතුන් ඇල්ලීමට විවිධ උපක්‍රම භාවිත කළ බව ඒවායේ සඳහන්ව ඇතත් මන්තර කීමක් පිළිබඳව සඳහන් නොවෙයි. අලි මන්තර දන්නා ගොවි මහතුන් අදද රජරට සිටිනවා විය හැකිය.

හේනට හෝ කුඹුරට එන වල් අලියා පන්නා දමන්නට මෑතක සිට "හක්කපටස්" භාවිත කරති. සිංහල වදන් මාලාවට අලුතින් එකතුව ඇති එකී සූත්‍රය බෙහෙවින්ම ම්ලේච්ඡ ක්‍රියාවකි. වන අලි තුරන් කිරීමට හේනේ වට්ටක්කා ගෙඩියට කෘමිනාශක යොදන ගොවියා ගොවියෙකු නොවේ. මාරයෙකි. පරාල ඇණ ගැසූ ලෑලි පුවරු සඟවා තබා අලිඇතුන් බිම හෙළන්නෝ යමපල්ලෝ වෙති. ගිණිකඳයාගේ මුවින් පිටකරන ගිණි උණ්ඩ මඟින් අලිඇතුන් බිම බාවනුයේ සතුන් පිළිබඳ මෛත්‍රියක් නැති අධමයින්ය. රජයේ වියදමින් විදුලි රැහැන් යෙදීමත් අලි වෙඩි ගසා අලි ඇතුන් පළවා

2. කොකවියගොල්ලෑවේ අලි මන්තර පොත, පිහිඹියගොල්ලෑවේ ආරියරත්න මහතා විසින් සපයන ලදී. 2014.10.24.

හැරීමත් මෙන්ම බැරිම තැනකදී එන්නත් මඟින් නිර්වින්දනය කරනුයේත් ජීවිත ආරක්ෂා කරගැනීම සඳහාය. සතාට හිංසාවක් නොවන පරිදි උපක්‍රම යෙදීම ඉතා උචිතය. ගොවි ජනතාවගේ ආරක්ෂාවත් බව භෝගවල ආරක්ෂාවත් සලස්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. පුරාතනයේදී මේ සඳහා යෙදූ උපක්‍රම අදට ගැළපේදැයි කෙනෙකුට ප්‍රශ්නයක් විය හැකිය.

මෙයින් පැහැදිලි කිරීමට උත්සාහ ගනු ලබන්නේ ඉහත සඳහන් කළ අලි මන්තර පොත ඇසුරින් තරමක් ගෙන හැර පෑමයි. රජරට ගොවියෝ අතර මේ කෙම් ක්‍රම බහුලව භාවිත වූ බවට කරුණු පවතී. ඉතා මෑත දිනක අප හමුවීමට පැමිණි දන්නා මහත්මයෙකු සමඟ මේ සම්බන්ධයෙන් කතා කළ විට ඒ මහතා මෙසේ සඳහන් කළේය. "..... ඔව් මහත්තයෝ අපේ අත්තා හේනේ ආරක්ෂාවට හේන හතර කොණ මන්තර කළ ගල් වැළලුවා. ඊට පස්සේ හේනට අලින්ගෙන් හානියක් උනේ නෑ." මේ පුවත අදාළ වන්නේ අනුරාධපුර මරදන්කඩවල ප්‍රදේශයට ආසන්න උච්චිමඩුව නම් පුරාණ ගම්මානයටය. වල් අලි පන්නා දැමීම සඳහා එබඳු දේ සිදු කිරීම ඇසින් දුටු අය තවම අප රටේ සිටින බව ඉන් ගම්‍ය වේ. අලි මන්තර ගැන මහින්ද ගමගේ ඇල්ලලගොඩ මහතා මෙසේ වාර්තා කරයි:

"..... වන සීමාව අසල ගොවිතැන් කිරීම නිසා අලියා ගොවියාගේ හතුරකු වන්නට විය. එහෙත් ගොවියා ඔවුනට අනුකම්පා කළේය. බුදු දහම ඇසුරෙන් ලත් ආභාසය නිසා ඔවුන්ගේ ජීවිතයට හානි නොකළේය. නමුත් ඔවුන් එළවා දැමීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කළහ. එහෙත් ඒවා අසාර්ථක වූ කල අදෘෂ්‍යමාන බලවේගවල පිහිට පැතූහ. ගොවිපළේදී පමණක් නොව මඟතොටේදී පවා අලි ඇතුන් හමු විය. තනි අලියා, තුන්පත් රැල ආදීන්ගේ ජීවිතවලටද අවදානම් තත්ත්වයක් ඇතිවිය. මේ හේතුව නිසාම ශබ්ධ ශාස්ත්‍රයේ අනුහස් ඔවුහු ප්‍රයෝජනයට ගත්හ. එහි ප්‍රතිඵලයකි අලි මන්තර. අලි එලවීම සඳහා භාවිත කරන එම අලි මන්තර කිහිපයක් පහත සඳහන්ය.

"ඕං රිං ජයකාරි භවතුං
තණ්ඩාරව ගිනිධාරණී ධඃ"



"ඕං ශ්‍රීඃ බුද්ධස්ස ලෝකස්ස
එන්කට්ටි කන්දසාමි යහනේදිරි
දිරි සුඃ ඕං ශ්‍රී විෂ්ණු ජාහනී
අලි ශීත ජාහරියේ භගවතෝ සුඃ
ඕං කුමන්තරි කිඩංතරි නාලිකාලං
පඩත්තකාබාහු ඉමන්තරී පුත්තරී
තිමන්තරී උඃ යාල් තත්තී මගනේ
කිඩතරි අප්පා කිඩතරි ඒස්වාහඃ"

අලි එලවීම සඳහා පමණක් නොව අලි ඇල්ලීම සඳහාද මන්ත්‍ර ඇති බවත් ඒවා තමා ඉදිරියේ අත්හදා බලා පෙන් වූ බවත් අප රටේ විසූ ආර් එල් ස්පිට්ල් නම් සාහිත්‍යදර වෛද්‍යවරයා සිය පොත්පත් තුළින් හෙළි කරයි.[3]"

මේ ලිපියට ඉහත ප්‍රකාශය ඉතා වැදගත්ය. එක් තැනක පමණක් නොව බොහෝ තන්හි අලිමන්තර තිබුණු බව තහවුරු කිරීමට එය සාධකයකි. පොදුවේ ගත් කල අලි මන්තරවල පාඨ විවිධය. තේරුමක් නොදැනේ. සිංහල අකුරින් ඇතත් දෙමළ, පාලි, සංස්කෘත, සිංහල හා තවත් භාෂාවන්ගෙන් ලියා ඇති බව පැහැදිලිය. කෙටි මන්තර ක්‍රමයකි. මේවා අත්හදා බලන්නට පුලුවන් අවස්ථාද බැරි අවස්ථාද ඇත්තේය.

## කොකටියගොල්ලෑවේ අලි මන්තර පොත

පොතේ පුස්කොළ පත් ඉරු දොළසක් විය. දිග අඟල් හයකි. පළල අඟල් දෙකකි. කියවා ගැනීමට අපහසුය. ඉතා අසිරුවෙන් දින ගණනාවක් ගත කොට කියවා ගතිමි. එහි ඇති මන්තර කීපයක් හා උපයෝගිතා කරුණු කීපයක් මෙහි බහාලමි. මුඛ පරම්පරාවෙන් පැවතුණු මෙබඳු මන්ත්‍ර පසු කලෙක ලේඛනගත වීමේදී අක්ෂර හා වචන නිවැරදිව ලේඛනාරූඪ වූයේද යනු සැක සහිතයි. ඒවා තවද පිටපත් කිරීමේදී යම්යම් අඩුවැඩි සිදුවන්නට ඇතැයිද සිතිය හැකිය. ඒ හෙයින් මෙම ලේඛන පිළිබඳ තක්සේරු තැබීම දුෂ්කර

3. **ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සහ සිංහල සංස්කෘතියේ ඇත් පවුර**, මහින්ද ගමගේ ඇල්ලලගොඩ, එස් ගොඩගේ, කොළඹ, 2004.

වුවත් ලේඛනයෙහි පැවති අයුරින්ම අනුලේඛන කිරීමට කටයුතු යෙදින. මෙබඳු දේ ඒ ආකාරයෙන් හෝ සංරක්ෂණ කිරීම කාලීන අවැසියාවකි.

නමඃ ශ්‍රී සණාය.

ඕන් මහාමායදේවීඟන සද්ධර්ම දිෂ්ටි මහවිෂ්ණු නාරායනේ නමෝ නමඃ. මහාමායා උග්‍රතේජේන නාරායනේ නමෝ නමඃ අලියට හා ඇතාටය ඇතින්නියට මා සරවන පවස මුඛායා ඕං උද්දංඩ බහිරවයා සිවායා නමඃ

රත්හඳුන් හෙලහඳුන් දෙක එක්කොට අටෝරාසියක් මතුරා තිලක දී අඬගසනු එත්.

ඕන් මැද්දදේසේ උපන් අයිරාවන නං මායා රන්කොත් පිහිටුවා ගෙන බුදුරැස් පිහිටුවා ගෙන බුදුන් වඩාගෙන අරහත් දරාගෙන භවතුන් පරිවරාගෙන සිංහයා පිටින් එන මාගේ ගිනිහුලට නො සිට බැහැගන් දේවතාවා බැහැගං....

ඕන් නමෝ නාලාගිරි මුදුනේ උපන් නීලගිරි දේවතාවානං මමය ගිනිසේ එන ජගත් දියසේ නැවත නැවතී බැහැ දේවතාවා බැහැගං...

ගිණිහුලට සත් විටක් දපා අල්ලනු පසු නොබලා දුවයි. ගල් මතුරා ගසහොත් හුලට කී තැනේදී ගලට මතුරා ගසනු. ඕන් කන්දකුමාරයානේ සිඃ යන්ට. ඕන් අරි අරී නබා ගරුණී ගජමුකා තැරි. ඕන් සිවමුනි සරනේ ආනන්ද රූපාථු. ඇතු හා අලියට නමෝ ශ්‍රී සනාහාරේ භවතු. අලියට ඕන් අරි අරී නබා ගරුඩ ඕපු විෂ්ණු අලිකී අලි ජාණකී හපේ හවථු. ඇතු හා අලිට.

ඕන් ගජාණ භාසුරා බහ. ඕන් ගිඩි තිත්තාභාසුරා හෝ පල්ලා භාසුරා බහ. යන්ට ඔන්සාරි විෂ්ණු පරාජානේ විෂ්ණු වාහාස් ස්මාස් උග්‍රතේජ විෂ්ණු නමේ නාරායනාන් ක්‍රතේජා හෝ ජාහෝ සිග සීග්‍ර ක්ජානේ. රැලට සිහිකළ පමණින් බිදී යෙත්.

ඕන් සිවෝම් අයින් කට්ටු මයින් කට්ටු බෝය සත් කට්ටු බෝය මණ්ඩලට කට්ටු නාලුකො නමුන් කට්ටු එට්ටුන් තැක්කුනෝ නමුන් කට්ටු අප්පුලන්ද්‍ර වලල්ලා කපාලා සිවගුරු තම්රානේ කට්ටු



ඕන් ගජමුඛ නාරසිංහ බහිරවයා කට්ටු අදි අන්නදි රූප කට්ටු එන් කට්ටු වන්කට්ටු පුර කට්ටු රකට්ටු සුන්දර සූරියානේ කට්ටු පුට්ටු එස්වා කා තෙලට හඳුනට පවිත්‍ර ඇතුව අටෝරාසියක් දපා තියා දස්කමට යනු තිලක දී යනු පුවක් නොකනු මනා තැනකට රැ දවල් යනු ඇතුන් ජීවමයි. නමෝ නාලාගිරියා එදා ලූ පුතුන් තානිසා නොවේද මෙමා නිසා මායා ඒ අනිණඩහේ නොයා මෙහෙම එව.... යමෙකු කරා එලවා එන විට සිහිකර අඬගසනු.

උඳුපියලි මී තෙලින් බැද කොටා දිඹුල පතේලා තුන්පිටි අල්ලක් බත් මුසුව වළලා දෙවනු බත් අනුබව කොට දස්කමට යනු ඇනුන් පැන්නුම් දෙකට අසුනොවෙයි.

රුක් අත්තන මුල් සත්සඳ මුල් ජටාමාංශ අත්තරවේරි රසදිය පරංගි පාසායං නාගපාසානං හරංකහ දේවදාර හිරියල් කොසඹ මුල් මේවා පිරිසිදුව වටා බේත් වලලු මුදුගුලියක් බදිනු ඇනුං පැන්නුන් ආදිය බැරිවෙයි. අත්දුටුවයි.

ඕන් පෙරදුටු අංගිලිමාලයින්නේ සුවඳැල් පඳුරක් ඇත. ඒ සුවඳැල් පඳුර කණ්ඩ අරක් කෙල්ලී කියන අතින්නීත් ගල්ලේ කුකු කියන ඇතින්නීත් දෙන්නා එන වේලාවට පෙරදා වූ අංගුලිමාලයෝ ගල්සතරක් මතුරා සතර කොණ තිබු ආඥාවෙන් ආනුබාවෙන් මාගේ කෙත දෙස නේන්ඩ

නොබලාන්ඩ සර්ව ආරක්ෂා ඕන් නමෝ ඔට්ටු කංජ් ඔට්ටු සරනේක්කංජ් සං ගුද්‍රි සංගුසක්ක්‍රම් දී අසෝරා කපතියා නේතිද්‍ර දපා වැටුනෝත් උඟත් වැටෙයි.

දෙසඳුන් හොඬල අල තොලබෝ අල බෝකිරෙන් පිරිසිදුව පංචෝපකාරයෙන් වටා නමෝ යන අකුරු ඒ බෙහෙතෙන් අතේ ලියා අත උඩුකුරු කොට සී කියා ඇතුන් නවතනු. නේත්.

වංඩානාමිනෙරි වියශැස්ත්‍රවේදි ගරුඬ පාසාසං රසදිය කලු තුන්බෝ අත්තන ඇට එමපත් යුසින් රසදිය විසමරා දෙදුන් කහලේන් අත් පස්ලෝ යහුනු මේදේ ගල් දිය රුක් සිදුරු දිය මෙහි හෙව පංචෝ පවාරනයෙන් සුරැකීව වටා අසුර තබා දස්කමට යනවිට මිහිරිදියෙන් නලල තිලක දී යනු ඇතුන් අලින්ට සිංහයා පෙනෙයි. කතා කල විට සන්දි දැව බිදි වලංගු නැතුව හිටින්. අන්දිරංග මත යෙන් තිලක දී යනු ගජබිය නැතිවෙයි.

බන්ද බන්ද සිද්ධි සිද්දි කුරු කුරු යේශ්වඃ. අටෝරාසියක් ගල් සතරකට දපා වලලනු සීමාවයි. ඇත් ජිවමයි.

ඕම් අග්ගිනියෝණ්ඩු ගණවතියෙන්ද වරතේ වුගල්පගවේ තේප්පැත් එන්නෙප්පාත් ආනේ වන්නේර්ප්පාකීකත් කෙට්වු නාවුලුන්ද පොවෝ සිවාකා. වීරපත්තිරවත්තිරම්. මදූ පොලු ඉඩක්කට්වු පටිවලට මතුරගනු ඇතුන් අලින්ගේ පෙනපතේ සතරපය වලංගු නැතිවෙයි. ඉනවතට උරමාලෙට මතුරනු. ඕන් අරිගරුවේ නමඃ. අරි ඕමාවිල්ලවදනත් අම්මේයා පොලේඩුක් ආදි විට්ටුනු ගාතේ පොල්ලුත්තෝඩාදු. මේ මතුරා පොල්ල අල්ලනු ඇතා නාල්ලනු මිනිහා වැටුන තැනට යේනත් මණිසන්තෝංඩාදු කියා මතුරනු.

ඇතුන් හා අලින්ගෙන් ඇතිවන විවිධ උපද්‍රව සඳහා ඉහත ආකාරයේ මන්තර මෙහි තවද අන්තර්ගත වෙයි. එමෙන්ම අලි ඇතුන් අල්ලන්නටද මන්තර මෙහි තිබේ. ඉන් එකක් මෙසේයි.

අලිරැල වටකොට මැදට පැන මන්තරය අතට මතුරා සොඬ පිසලා සොඬට ගසා  ඕම් සිව කදිරගුරු කුමාරයා නේවායි කියා සොඬට ගසා කට ආය කී කලට කට ආයයි. ඕන් එන් පිරාණවා මුණියාණක්ක කියා අතට මතුරා කටට අත පොවා කටේ තිබෙන රොඩු අතට ගෙනවිත් තමාගේ ගුරුන්ගේ පයමුල තියා තෑගි ලබනු. වට්ටන මන්තරයයි.

ඉන් පෙනී යනුයේ අලිමන්තර පුහුණුකර සිසුන්ගේ දස්කම් බැලූ ගුරුවරු ඉතා මෑත කාලයේද සිට ඇති බවයි. වල් අලියාගේ කට තුළට අත යවන්න තරම් නිර්භීත කමක් ඒ මන්තරවලින් ලැබෙන්නට ඇත. අලිරැලින් වෙන් කරවා ගන්නටද මන්තර තිබේ. ඉන් එකක් මෙසේය.


ඕම් අගත්තියානේ පොරුම්. මේ මන්තරයෙන් මතුරා හූ කීකල රැල බිදීයෙන්. අරබම් කිලියුම් සවුවම්, යන මන්තර අතට මතුරා හොස්ස අල්ලනු.  ඕන් කනුපුට්වු කනව පූට්වූ  මෙම මන්තරයෙන් ලිතිපල්ලට මතුරා ඒ පල්ලේ දගේ වැටී තිබෙන අතට තදකර අල්ලනු මදූ ගැලවෙයි.



අලි ඇල්ලීමට කණ්ඩායම් සිටි බව මේ සටහනින් පැහැදිලි වෙයි. එනම් "වෙන කුට්ටමක මිනිසේසු දස්කමට ඇවිත් බදත් නං ඕන් විලක්කල් ලත්තු විනවාද කායි තිකල්ලන්තු මේ මන්තරයෙන් ලිතියපල්ල දඟ යන අතටය අඹරා අල්ලනු. සියයක් වරක් බැඳුවත් මදූ ගැලවෙයි. ඕන් ක්‍රිං සිංහං සිමායා නමඃ දෙමට මලට මේ මන්තරයෙන් සත් වරක් මතුරා කටේ තියාගෙන හිටලා බදවනට ඌ නැවෙන කොට මෙතන ඌ දෙස බලා දෙමට මල හපනු  දතින් ඔලුව පාගා හපයි. මේ ශැටී කරන්ඩ එපා." ඉහත මන්තරයෙන් සිදු කිරීමට බලාපොරොත්තු වන්නේ අලි අල්ලන වෙනත් අයෙකුට අලි ලවාම දඩුවම් දීමක්ය. එය කරනත් එපා කියා මෙහිම උපදෙස් සපයා ඇත.

මෙම මන්තරය අතට මතුරා අත්පොලසන් දුන් විට අලි ඇතුන් රැල බිඳී දුවති. ලේවුන්ද කන වති මුඛන් කොඩුවත් දෙන්වාරි එන්නුම් පුඩියානේ වන්දු කොමාන් වට්වු මූඩන් කාරායනේ තගිලේ නඩුන්නාගා කන්නොරියාවේකාදු කේලාවේ පෝග පෝගවේ සිවායා නමඃ. ඇතු හා අලිට නමෝ තථතරිප්‍රඃ මේ මන්තරයෙන් ගලට මතුරා ගසනු. දුවත්. ඕම් අරිරාව පත්තිරා ආයෝධ්‍යා පත්තිරා අයියුම් කිලියුම් අගේරපත්තිරාණෙ. අස්ස ජගම් පට්වු මූලවේ සිවාකා  සතර වරක් උරමාලෙට මතුරා ගැටගසා පන්නා එන විට බිම දමා තමා දන ගසනු ඌත් දනගසයි. අලි රැල මැදට පනින මන්තරයක් වේ. පොතේ මෙසේ සඳහන් වෙයි. "අරි ඕන්නවයා පොවිතිවිට්ටුනුයාම් උම්මේයනේ කාදුකාන්වුඩි  කියා සත්වරක් අතට දපා අත නගා රැල මැදට පනිනු."

සම්ප්‍රදායික දැනුම අතරට අයත් මෙබඳු නස්පර්ශිත උරුම සාධක සංරක්ෂණය කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ සඳහා ඒවා ඇති තැන් සොයා යා යුතුය. ඇතැම් තැනක අභාවිත පුස්කොළ පිටපත් එකතු තුළද මේවා තිබිය හැකිය. අපගේ අත්දැකීම අනුව මේ වන විට අප්‍රකට තොරතුරු රැසක් පුස්කොළ පිටපත් ඇසුරින් අනාවරණයව තිබෙයි. මේවා පිළිබඳව තවද තොරතුරු සොයන පර්යේෂකයන් ඇති බව විශ්වාස කරමි. පුස්කොළ භාවිතය හෝ පුස්කොළ පිටපත් කියවීමට අවස්ථාවක් නොමැති පාඨකයින් සඳහා ඒවා ප්‍රයෝජනවත් වනු ඇත. අදාළ පිටපතේ එක්තරා කොටසක් පමණක් උපුටා ගෙන ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.



පුස්කොළ පොතේ ඡායාරූපයක්